# FINANCIAL STATEMENTS OF A SOLE PROPRIETORSHIP BUSINESS (Part-I)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# මූල්‍ය ප්‍රතිඵලය ගණනය කිරීම

ගිණුම් කාලච්ඡේදයට අදාළ මූල්‍ය ප්‍රතිඵලය ගණනය කිරීම සඳහා ගැලපුම් සිදු කළ යුතුය.

ඒ සඳහා ආදායම් ප්‍රකාශනය / ලාභ හෝ අලාභ ප්‍රකාශනය පිළියෙල කළ යුතු ය.

නිශ්චිත දිනකට මූල්‍ය තත්ත්වය අනාවරණය කර ගැනීම සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කළ යුතු ය.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ගිණුම්කරණ සංකල්ප, ප්‍රමිත සහා සම්ප්‍රදායන් සැලකිල්ලට ගත යුතුය.

ආදායම් ප්‍රකාශනය තිරස් හා සිරස් ආකෘතියට පිළියෙල කළ හැකිය.

ClassWork.LK

# මූල්‍ය ප්‍රතිඵලය ගණනය කිරීම සඳහා භාවිතා කරන ගැලපුම් සටහන් සඳහා අදාළ ද්විත්ව සටහන්

| ගැලපුම | ද්විත්ව සටහන |
|---|---|
| 1. අවසාන ඉතිරි තොගය | ඉතිරි බඩු තොග ගිණුම (හර)<br>වෙළෙඳ ගිණුම/ආදායම් ප්‍රකාශනය (බැර) |
| 2. භාණ්ඩ ගැනිලි | ගැනිලි ගිණුම (හර)<br>ගැනුම් ගිණුම (බැර) |
| 3. තොග පරිත්‍යාග | තොග පරිත්‍යාග ගිණුම (හර)<br>ගැනුම් ගිණුම (බැර) |
| 4. උපචිත වියදම් | අදාළ වියදම් ගිණුම් (හර)<br>උපචිත වියදම් (බැර) |
| 5. ලැබිය යුතු ආදායම් | ලැබිය යුතු ආදායම් ගිණුම (හර)<br>අදාළ ආදායම් ගිණුම (බැර) |
| 6. ඉදිරියට ගෙවූ වියදම් | ඉදිරියට ගෙවූ වියදම් ගිණුම (හර)<br>අදාළ වියදම් ගිණුම (බැර) |
| 7. කලින් ලද ආදායම් | අදාළ ආදායම් ගිණුම (හර)<br>කලින් ලද ආදායම් ගිණුම (බැර) |
| 8. බොල් ණය | බොල් ණය ගිණුම (හර)<br>ණයගැති පාලන ගිණුම (බැර) |
| 9. අඩමාණ ණය වෙන් කිරීම | අඩමාන ණය ගිණුම (හර)<br>අඩමාන ණය වෙන් කිරීම් ගිණුම (බැර) |
| 10. දේපළ පිරියත ක්ෂය | ක්ෂය ගිණුම (හර)<br>සමුච්චිත ක්ෂය ගිණුම (බැර) |

ClassWork.LK

## විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත යවන ලද භාණ්ඩ

### භාණ්ඩ යවන අවස්ථාවේදී,

විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත භාණ්ඩ යවන අවස්ථාවේදී ඒවා සම්බන්ධයෙන් සිහිවටන සටහනක් පමණක් ව්‍යාපාරය තබා ගනියි.
විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත භාණ්ඩ යවන අවස්ථාවේදී ද්විත්ව සටහන් නොතබයි.

### බඩු තොගය විකුණන ලද බව ව්‍යාපාරයට දැනුම් දුන් විට / විකිණීමට ඉඩ දුන් කාලසීමාව ඉකුත් ව ඇති විට,

විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත යවන ලද භාණ්ඩ ගණුදෙනුකරු / නියෝජිතයා එම බඩු තොගය විකුණන ලද බව ව්‍යාපාරයට දැනුම් දුන් විට හෝ අදාළ තොග විකිණීමට ඉඩ දුන් කාලසීමාව ඉකුත් ව ඇත්නම් අදාළ වටිනාකම ගිණුම්ගත කරන ආකාරය

ණය ගැති පාලන ගිණුම (හර)
විකුණුම් ගිණුම (බැර)

ClassWork.LK

## ගිනුම් කාලච්ඡේදය අවසාන දින වන විටත් එම බඩු තොගය විකිණී නොමැති විට,

ගිනුම් කාලච්ඡේදය අවසාන දින වන විට විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත යවන ලද භාණ්ඩ තොගය විකිණී නොමැති නම් සහා අනුමත කාලය ඉකුත්ව නැතිනම් එකී තොගයේ පිරිවැය අවසාන තොගයට එකතු කළ යුතුය.

## යවන ලද තොග වැරදීමකින් විකුණුම් ලෙස ගිණුම්ගත වී ඇති විට,

යවන ලද තොග වැරදීමකින් විකුණුම් ලෙස ගිණුම්ගත වී ඇත්නම් එම ප්‍රමාණය පහත පරිදි ගැලපීම් කළ යුතුය.

| | |
|---|---|
| විකුණුම් ගිණුම | (හර) |
| ණයගැති පාලන ගිණුම | (බැර) |

ClassWork.LK

# තොග හානි වීම ගැලපීම් කරන ආකාරය

## තොගයක් ගින්නකින් හෝ වෙනත් හේතුවක් මත හානිවුව හොත්,

විකිණීම සඳහා ලබා ගත් තොගයක් ගින්නකින් හෝ වෙනත් හේතුවක් මත හානිවුව හොත් එම හානි වූ තොගයේ පිරිවැය පහත පරිදි වාර්තා කළ යුතුය.

හානි වූ තොග ගිණුම (හර)
ගැනුම් ගිණුම (බැර)

## හානි වූ තොග රක්ෂණය කර තිබුණේ නම්,

හානි වූ තොග රක්ෂණය කර තිබුණේ නම් එහි දී දීමට එකඟ වූ රක්ෂණ වන්දිය ගැලපීම් කරන ආකාරය

ලැබිය යුතු රක්ෂණ වන්දි ගිණුම (හර)
හානි වූ තොග ගිණුම (බැර)

හානි වූ තොග ගිණුමේ ශේෂය (අලාභය) ආදායම් ප්‍රකාශනයේ වෙනත් වියදම් යටතේ දැක්විය යුතුය.

ClassWork.LK

# <u>නිදසුන්</u>

(01) සුභසිංහගේ ව්‍යාපාරයේ මූල්‍ය ප්‍රකාශන සම්ප්‍රදායික ආකෘතියට පහත ආකාරයට ඉදිරිපත් කළ හැකි ය.

සුභසිංහ ව්‍යාපාරය

2017/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

| | | | | | රු. |
|---|---|---|---|---|---|
| 2016/04/01 තොගය | | 8 000 | විකුණුම් | | |
| + ගැනුම් | | | (200 000 - 6 000) | 194 000 | |
| (80 0000 - 5 000 - 2000) | 73 000 | | ආපසු එවුම් | (10 000) | 184 000 |
| ගෙන ඒමේ කුල | 4 000 | | | | |
| | | 77 000 | | | |
| | | 85 000 | | | |
| - 2017/03/31 තොගය | | (18 000) | | | |
| විකුණුම් පිරිවැය | | 67 000 | | | |
| දළ ලාභය ප/ගෙ | | 117 000 | | | |
| | | 184 000 | | | 184 000 |
| | | | දළ ලාභය ඉ/ගෙ | | |
| බෙදා හැරීමේ වියදම් | | | වෙනත් ආදායම් | | |
| ප්‍රචාරණය | 1 000 | | ගෙවල් කුලී ආදායම් | | 5 000 |
| මෝටර් රථ ක්ෂය | 7 500 | | | | |
| බොල් ණය | 1 000 | | | | |
| අඩමාණ ණය | 150 | | | | |
| විකුණුම් වියදම් | 4 000 | 13 650 | | | |
| | | | | | |
| පරිපාලන වියදම් | | | | | |
| විදුලිය | 6 000 | | | | |
| ලී බඩු ක්ෂය | 500 | | | | |
| වැටුප් හා වේතන | 15 000 | 21 500 | | | |

ClassWork.LK

| | | | | | |
|---|---|---|---|---|---|
| මූල්‍ය හා වෙනත් වියදම් | | | | | |
| තොග හානි | 2 000 | | | | |
| ණය පොළී | 5 000 | | | | |
| බැංකු ගාස්තු | 1 500 | 8 500 | | | |
| ශුද්ධ ලාභය ප්‍රාග්ධන | | 78 350 | | | |
| ගිණුමට ගෙන ගියා | | 122 000 | | | 122 000 |

## සුභසිංහ ව්‍යාපාරය

## 2017/03/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | | | | | | රු. |
|---|---|---|---|---|---|---|
| | | | | පිරිවැය | සමුච්චිත ක්ෂය | ධාරණ අගය |
| හිමිකම් | | | ජංගම නොවන වත්කම් | | | |
| ප්‍රාග්ධනය | 100 000 | | | | | |
| + ශුද්ධ ලාභය | 78 350 | | ඉඩම් හා ගොඩනැගිලි | 150 000 | - | 150 000 |
| | 178 350 | | මෝටර් රථ | 75 000 | 7 500 | 67 500 |
| - ගැනිලි | (2 000) | 176 350 | ලී බඩු | 10 000 | 500 | 9 500 |
| | | | | 235 000 | 8 000 | 227 000 |
| ජංගම නොවන වගකීම් | | | ජංගම වත්කම් | | | |
| 10% බැංකු ණය | | 50 000 | තොගය | | 18 000 | |
| | | | ණයගැතියො | 3 000 | | |
| | | | - අඩමාණ ණය වෙ.කි | (150 | 2 850 | |
| | | | ලැබිය යුතු රක්ෂණ වන්දි | | 3 000 | |
| | | | ඉ/ගෙ ප්‍රචාරණය | | 2 000 | |
| | | | මුදල් | | 12 000 | 37 850 |
| ජංගම වගකීම් | | | | | | |
| ණයහිමියෝ | 26 500 | | | | | |
| උපචිත ගෙන | 2 000 | | | | | |

ClassWork.LK

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ඒමේ කුලී | | | | | | |
| උපචිත විදුලිය | 1 000 | | | | | |
| උපචිත ණය පොළ | 5 000 | | | | | |
| කලින් ලද ගෙවල් | | | | | | |
| කුලී | 4 000 | 38 500 | | | | |
| | | 264 850 | | | | 264 850 |

**පෙර වැඩ :**

| | |
|---|---|
| ණයගැතියෝ | 10 000 |
| - බොල් ණය | (1 000) |
| ආපසු එවුම් පදනම | (6 000) |
| | 3 000 |

අඩමානණය වෙන් කිරීම $3000 \times \frac{5}{100} = \underline{\underline{150}}$

**ඉහත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති ආකාරය අධ්‍යයනය කරන්න.**

ClassWork.LK

(02)

## නවාස්ගේ ව්‍යාපාරය
## 2017/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

| | | | රු |
|---|---|---|---|
| විකුණුම් | | 394 000 | |
| - ආපසු එවුම් | | (20 000) | 374 000 |
| | | | |
| **- විකුණුම් පිරිවැය** | | | |
| 2016/04/01 තොගය | | 16 000 | |
| + ගැණුම් (160 000 - 5 000 - 2 000) | 153 000 | | |
| ගෙන ඒමේ කුලී | 6 000 | 159 000 | |
| | | 175 000 | |
| - 2017. 08. 31 තොගය | | (18 000) | (157 000) |
| දළ ලාභය | | | 217 000 |
| **වෙනත් ආදායම්** | | | |
| + ගෙවල් කුලී ආදායම් | | | 14 000 |
| | | | 231 000 |
| **බෙදාහැරීමේ වියදම්** | | | |
| ප්‍රචාරණය | 4 000 | | |
| මෝටර් රථ ක්ෂය | 15 000 | | |
| බොල් හා අඩමාණ ණය | 1 650 | | |
| විකුණුම් වියදම් | 8 000 | 28 650 | |
| | | | |
| **පරිපාලන වියදම්** | | | |
| විදුලිය | 11 000 | | |
| ලී බඩු ක්ෂය | 1 000 | | |
| වැටුප් හා වේතන | 30 000 | 42 000 | |
| **මූල්‍ය හා වෙනත් වියදම්** | | | |
| තොග හානි | 2 000 | | |
| ණය පොළ | 10 000 | | |
| බැංකු ගාස්තු | 3 000 | 15 000 | (85 650) |

ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට ගෙන/ගියා 145 350

ClassWork.LK

## නවාස් ව්‍යාපාරය
## 2017/03/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | පිරිවැය | සමුච්චිත ක්ෂය | ධාරණ අගය |
|---|---|---|---|
| | රු | රු | රු |
| **ජංගම නොවන වත්කම්** | | | |
| ඉඩම් හා ගොඩනැගිලි | 300 000 | - | 300 000 |
| මෝටර් රථ | 150 000 | 15 000 | 135 000 |
| ලී බඩු | 20 000 | 1 000 | 19 000 |
| | 470 000 | 16 000 | 454 000 |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | | 18 000 | |
| ණයගැතියො | 13 000 | | |
| (-) අඩමාණය ණය වෙන් කිරීම | (650) | 12 350 | |
| ලැබිය යුතු රක්ෂණ වන්දිය | | 3 000 | |
| ඉදිරියට ගෙවූ ප්‍රචාරණය | | 2 000 | |
| මුදල් | | 24 000 | 59 350 |
| **මුළු වත්කම්** | | | 513 350 |
| **හිමිකම් හා වගකීම්** | | | |
| 2016/04/01 ප්‍රාග්ධනය | | 200 000 | |
| + ශුද්ධ ලාභය | | 145 350 | |
| | | 345 350 | |
| (-) ගැනිලි | | (2 000) | 343 350 |
| ජංගම නොවන වගකීම් | | | |
| 10% බැංකු ණය | | | 100 000 |
| **ජංගම වගකීම්** | | | |
| ණයහිමියො | | 53 000 | |
| උපචිත ගෙන ඒමේ කුලී | | 2 000 | |
| උපචිත විදුලිය | | 1 000 | |
| උපචිත ණය පොළී | | 10 000 | |
| කලින් ලද ගෙවල් කුලිය | | 4 000 | |
| | | | 70 000 |
| මුළු හිමිකම් හා වගකීම් | | | 513 350 |

ClassWork.LK

ඉහත මුල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති ආකාරය අධ්‍යයනය කරන්න.

ClassWork.LK

(03) සේවක අර්ථසාධක අරමුදල් (EPF), සේවක භාර අරමුදල් (ETF) හා එකතු කළ අගය මත බදු (VAT) හා සම්බන්ධ ගැලපුම් සහිත කේවල ස්වාමි ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ආකාරය පහත නිදසුන් ඇසුරින් දැක්විය හැකි ය.

විමුක්තිගේ වෙළෙඳ ව්‍යාපාරයේ 2017. 03. 31 දිනට උපුටා ගත් ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| ගිණුමේ නම | හර (රු) | බැර (රු) |
|---|---|---|
| ඉඩම් පිරිවැයට | 1 000 000 | |
| ගොඩනැගිලි පිරිවැයට | 800 000 | |
| මෝටර් රථ පිරිවැයට | 1 200 000 | |
| සමුච්චිත ක්ෂය (2016. 04. 01 දිනට) | | |
| ගොඩනැගිලි | | 160 000 |
| මෝටර් රථ | | 240 000 |
| ගැනුම් | 345 000 | |
| විකුණුම් | - | 920 000 |
| තොගය (2016. 04. 01) | 30 000 | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ (ණයගැතියෝ) | 105 000 | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ (ණයහිමියෝ) | | 230 000 |
| වැටුප් හා වේතන (ශුද්ධ) | 72 000 | |
| අනෙකුත් පරිපාලන වියදම් | 23 000 | |
| 12% බැංකු ණය | | 100 000 |
| ගෙවූ බැංකු ණය පොළී | 9 000 | |
| පරිත්‍යාග | 2 000 | |
| මුදල් | 130 000 | |
| සුළු මුදල් | 10 000 | |
| වට්ටම් | 2 000 | 14 000 |
| ගැනිලි | 5 000 | |
| ප්‍රචාරණ වියදම් | 6 000 | |
| ගෙවූ VAT | 25 000 | |
| ප්‍රාග්ධනය | | 2 100 000 |
| | 3 764 000 | 3 764 000 |

ClassWork.LK

## මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සිදු කළ යුතු ගැලපීම්

2017. 03. 31 තොගය පිරිවැයට රු. 120 000 ක් වූ අතර එදිනට එහි ශුද්ධ උපලබ්ධි අගය රු. 100 000 කි.

ගොඩනැගිලි හා මෝටර් රථ පිරිවැය මත 10% බැගින් ක්ෂය කළ යුතු ය.

සේවක අර්ථසාධක අරමුදල (EPF) සේවක දායකය 10% ක් වන අතර සේව්‍ය දායකය 15% ක් වේ. සේවක භාර අරමුදල් දායකය (ETF) 3% ක් වේ. EPF සේවක දායකත්වය අඩු කර වැටුප් ගෙවා ඇත. EPF සහ ETF සම්බන්ධයෙන් වෙනත් ගැලපීම් සිදු කර නැත.

සියලුම ගැනුම් හා විකුණුම් ණය පදනම මත සිදු වේ. ගැනුම් හා විකුණුම් තුළ 15% ක (VAT) ඇතුළත් වේ. ව්‍යාපාරය VAT සඳහා ලියාපදිංචි වී ඇත.

බොල් ණය ලෙස රු. 5 000 ක් කපා හැරීම කළ යුතු අතර, ඉතිරි ණයගැතියන්ගෙන් 10% ක් අඩමාණ ණය ලෙස වෙන් කිරීමට තීරණය කර ඇත.

ClassWork.LK

ඉදිරියට ගෙවන ලද රු. 3 000 ක රක්ෂණ ගාස්තු පරිපාලන වියදම් තුළ ඇතුළත් වේ.

**අවශ්‍ය වන්නේ :**

2017. 03. 31 දිනෙන් අවසන් වසර සඳහා ආදායම් ප්‍රකාශනය

2017. 03. 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

ClassWork.LK

# <u>පිළිතුර</u>

විමුක්තිගේ වෙළෙඳ ව්‍යාපාරය

2017. 03. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

(රු.)

| | | | |
|---|---|---|---|
| විකුණුම් | | | 800 000 |
| 2016/04/01 තොගය | | 30 000 | |
| + ගැණුම් | | 300 000 | |
| විකිණීමට තිබූ තොගය | | 330 000 | |
| - 2017. 03. 31 තොගය | | (120 000) | |
| විකුණුම් පිරිවැය | | | (210 000) |
| දළ ලාභය | | | 590 000 |
| **වෙනත් ආදායම්** | | | |
| ලද වට්ටම් | | 14 000 | 14 000 |
| **බෙදාහැරීමේ වියදම්** | | | 604 000 |
| මෝටර් රථ ක්ෂය | 120 000 | | |
| බොල් ණය | 5 000 | | |
| අඩමාන ණය | 10 000 | | |
| දුන් වට්ටම් | 2 000 | | |
| ප්‍රචාරණ වියදම් | 6 000 | 143 000 | |
| **පරිපාලන වියදම්** | | | |
| ගොඩනැගිලි ක්ෂය | 80 000 | | |
| වැටුප් හා වේතන | 80 000 | | |
| EPF වියදම | 12 000 | | |
| ETF වියදම | 2 400 | | |
| වෙනත් පරිපාලන වියදම් | 20 000 | 194 400 | |
| **මූල්‍ය වියදම්** | | | |
| ණය පොළී | 12 000 | 12 000 | |
| **වෙනත් වියදම්** | | | |
| තොග කපා හැරීම | 20 000 | | |
| පරිත්‍යාග | 2 000 | 22 000 | (371 400) |
| **ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට මාරු කළා** | | | **<u>232 600</u>** |

ClassWork.LK

පෙර වැඩ

VAT සහිත වටිනාකම = VAT වටිනාකම + VAT රහිත වටිනාකම

$$115 = 15 + 100$$

විකුණුම් මත VAT = $\frac{920000}{115} \times 15 = \underline{\underline{120\ 000}}$

ගැණුම් මත VAT = $\frac{3450000}{115} \times 15 = \underline{\underline{45\ 000}}$

VAT ගිණුම

| | | | |
|---|---|---|---|
| මුදල් | 25 000 | විකුණුම් | 120 000 |
| ගැනුම් | 45 000 | | |
| ප/ගෙ | 50 000 | | |
| | 120 000 | | 120 000 |
| | | ඉ/ගෙ | 50 000 |

ගැනුම් ගිණුම

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ | 345 000 | VAT | 45 000 |
| | 120 000 | ආදායම් ප්‍රකාශනයට | 120 000 |
| | 345 000 | | 345 000 |

ClassWork.LK

විකුණුම් ගිණුම

| | | | |
|---|---|---|---|
| VAT | 120 000 | ඉ/ගෙ | 920 000 |
| ආදායම් ප්‍රකාශනයට | 45 000 | | |
| | 920 000 | | 920 000 |

අඩමාණ ණය = 105000
(5000)

$$100000 \times \frac{10}{100} = \underline{\underline{10\ 000}}$$

ClassWork.LK

# විමුක්තිගේ වෙළෙඳ ව්‍යාපාරය

## 2017. 03. 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(රු.)

| | පිරිවැය | සමුච්චිත ක්ෂය | ධාරණ අගය |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| ඉඩම් | 1 000 000 | - | 1 000 000 |
| ගොඩනැගිලි | 800 000 | 240 000 | 560 000 |
| මෝටර් රථ | 1 200 000 | 360 000 | 840 000 |
| | 3 000 000 | 600 000 | 2 400 000 |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | | 100 000 | |
| ඉදිරියට ගෙවූ රක්ෂණ ගාස්තු | | 3 000 | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 100 000 | | |
| - අඩමාන ණය වෙන් කිරීම | (10 000) | 90 000 | |
| මුදල් | | 130 000 | |
| සුළු මුදල් | | 10 000 | 333 000 |
| මුළු වත්කම් | | | 2733 000 |
| **හිමිකම් හා වගකීම්** | | | |
| ප්‍රාග්ධනය | | 2 100 000 | |
| + ශුද්ධ ලාභය | | 232 600 | |
| | | 2 332 600 | |
| - ගැනිලි | | (5 000) | 2 327 600 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| 12% බැංකු ණය | | 100 000 | 100 000 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 230 000 | |
| ගෙවිය යුතු EPF | | 20 000 | |
| ගෙවිය යුතු ETF | | 2 400 | |
| ගෙවිය යුතු VAT | | 50 000 | |
| උපචිත ණය පොලී | | 3 000 | 305 400 |
| මුළු හිමිකම් හා වගකීම් | | | 2 733 000 |

ClassWork.LK

පෙර වැඩ

| දළ වැටුප | = | EPF + | ශුද්ධ වැටුප |
|---|---|---|---|
| 115 | = | 15 + | 100 |

$$\text{EPF සේවක දායකය} = \frac{720000}{90} \times 10 = \underline{\underline{8\ 000}}$$

$$\text{EPF සේව්‍ය දායකය} = \frac{80000}{100} \times 15 = \underline{\underline{12\ 000}}$$

## වැටුප් හා වේතන ගිණුම

| | | | |
|---|---|---|---|
| මුදල් | 72 000 | ආදායම් ප්‍රකාශනයට | 80 000 |
| ගෙවිය යුතු EPF | 45 000 | | |
| | 120 000 | | 80 000 |

## EPF වියදම් ගිණුම

| | | | |
|---|---|---|---|
| ගෙවිය යුතු EPF | 12 000 | ආදායම් ප්‍රකාශනයට | 12 000 |
| | 12 000 | | 12 000 |

ClassWork.LK

## ගෙවිය යුතු EPF ගිණුම

| | | | |
|---|---|---|---|
| | | වැටුප් | 2 400 |
| | | EPF වියදම | 12 000 |
| ප/ගෙ | 20 000 | | |
| | 20 000 | | 20 000 |
| | | ඉ/ගෙ | 20 000 |

$$\text{EPF දායකය} = 80000 \times \frac{03}{100} = \underline{\underline{12\ 000}}$$

## ETF වියදම් ගිණුම

| | | | |
|---|---|---|---|
| ගෙවිය යුතු ETF | 2 400 | ආදායම් ප්‍රකාශනයට | 2 400 |
| | 2 400 | | 2 400 |

## ගෙවිය යුතු ETF ගිණුම

| | | | |
|---|---|---|---|
| | | ETF වියදම | 2 400 |
| ප/ගෙ | 2 400 | | |
| ප/ගෙ | 2 400 | | 2 400 |
| | | ඉ/ගෙ | 2 400 |

ClassWork.LK

## අභ්‍යාස

(01) කේවල ස්වාමි ව්‍යාපාරයක මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කිරීම සඳහා පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශනය නම් කරන්න.

(02) පහත සඳහන් ගැලපුම් සටහන්වලට අදාළ ද්විත්ව සටහන් ලියන්න.

ගෙවිය යුතු විදුලිය

ඉදිරියට ගෙවූ රක්ෂණ වාරිකය

කලින් ලද ගෙවල් කුලී ආදායම

ලැබිය යුතු පොලී ආදායම

(03) විකුණුම් පිරිවැය ගණනය කරන ආකාරය දක්වන්න.

ClassWork.LK

(04) 2017. 03. 31 දිනට අමිල ව්‍යාපාරයේ ගිණුම් පොත්වලින් පහත තොරතුරු ඔබට සපයයි.

| | |
|---|---|
| භෞතික තොගය (2017. 03. 31) | 150 000 |
| ණයගැතියෝ | 120 000 |
| විකුණුම් | 850 000 |

විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත ගනුදෙනුකරුවන්ට රු. 60 000 ක් පිරිවැය වූ භාණ්ඩ 75 000 කට ඉන්වොයිස් කර ඇත. ආපසු එවීමේ කාලය ඉක්මනොවූ මෙම බඩු තොගයෙන් 60% ක් 2017. 03. 31 දිනට විකුණා ඇති බව අනාවරණය කර ගෙන ඇත.

පහත එක් එක් අවස්ථා යටතේ ඒ ඒ ගිණුම් ශේෂයන් ගණනය කරන්න.

- තොග යවන අවස්ථාවේ නාමික සටහනක් තබා තොග භාර දී ඇති විටක,
- තොග යවන අවස්ථාවේ මුළු වටිනාකම ණයට විකුණුම් ලෙස වාර්තා කර ඇති විටක,

| | 2017. 03. 31 තොගය | 2017.03.31 දිනට ණයගැති වටිනාකම | විකුණුම් වටිනාකම |
|---|---|---|---|
| | | | |
| | | | |

ClassWork.LK


පළමු මස
නොමිලේ...
2022
ADVANCED
LEVEL
ACCOUNTING
MASS CLASS
ONLINE CLASS
ZOOM තාක්ෂණය ඔස්සේ...
මාර්තු
26
ලියාපදිංචි වීමට :-
076 36 55 550
සෙනසුරාදා
උදෑසන 8.30
සුපුන් මදුශංක
B.sc.(Mgt) Accounting (Special) (U.G.)
University of Sri Jayewardenepura